ආසියාවේ පළුවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2014 නොවැම්බර් 17 සඳුදා
07 වෙළුම - 04 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 36/ News/ 2014

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



## පූජා සහායක දරුවන්ගේ නාම සාන්තුවරයා
# ශා. ජෝන් බර්ච්මන් මුනිතුමා

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611

ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com

වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# අප රටේ පැවති පංච මහා වාද ගැන අපිත් දැනුම්වත් වෙමුද?

**(කතෝලික කවුරුත් මේ වාද වලට සහභාගි වී නැහැ)**

## ආදරණීය දුවේ පුතේ...

මීට ශත වර්ෂ දෙකකට ඉහත අප රටේ එක්තරා වාද සංග්‍රමයක් පැවතුනා. ඉතිහාසයේ පංච මහා වාද යනුවෙන් හැඳින්වෙන මේ සමයාන්තර වාදයන් ගැන තොරතුරු විමසන කල ඒ මගින් අපේ සාහිත්‍ය නම් තරමකින් පෝෂණය වූ බවක් පෙනෙනවා. මෙවා ඇති වුයේ 19 වන සියවසේ මුල් භාගයේදීයි. බෞද්ධ - ක්‍රිස්තියානි , ගිහි - පැවිදි උගත් යයි කියා ගත් කොටසක් මේ පංච මහා වාදයන්ද දිරි දුන් බවත් සඳහන් වෙනවා.

එකළ තිබුනේ කතෝලික නොවන ක්‍රිස්තියානි අධිපති පාලනයක්. මේ පාලන කාලය තුළදී යම් යම් තාන්න මාන්න හේතුවෙන් බෞද්ධයින් සැලකිය යුතු පිරිසක් ක්‍රිස්තියානි ආගම වැළඳ ගත්තා. ඒ සමයෙහි පලවු ක්‍රිස්තියානි දහම පිළිබඳව රචනා වු පොත්පත් ඔවුන් අතර බෙහෙවින් ජනප්‍රිය වුනා. මෙය බෞද්ධයින් හට අකැප වූ අතර සිංහල බෞද්ධයින් අතර එකමුතු බවත් ඇති කරන්නට හා ඔවුන් අතර ජීවලිත බවක් දනවන්නට යම් යම් කණ්ඩායම් උත්සහ ගත්තා. එයට එක් ප්‍රතිකර්මයක් හැටියට ඔවුන් යොද ගත්තේ බෞද්ධ පොත පත වැඩි වැඩියෙන් මුද්‍රණය කොට එළි දැක්වීමයි. ක්‍රිස්තියානි පාර්ශවය මෙන්ම බෞද්ධ පාර්ශ්වයන් තරගයට මෙන් තම අදහස් කැටි කොට පොත පත මුද්‍රණය කරන්න වෙහෙසීම නිසා එකල සාහිත්‍යයේ යම් පිබිදීමක් ඇති වුවා යන්න සඳහන් කළේ ඒ නිසායි. පොත පත බහුල මෙන්ම ඒවා කියවීමට රුචි පාඨක පිරිසක්ද රට තුළ නිර්මානය වුනා. ආගමික ස්ථාන ආශ්‍රිතව ඒ ඒ දහම් සාරය කැටි කොට ගත් පොත්පත් විශාල සංඛ්‍යාවක් ජනයා අතර ගැවසෙන්නට වුනා. මේ යටතේ දෙපාර්ශවයම තමන් පමණක් නිවැරදිය යන මතයේම කටයුතු කරන්නට යෑම නිසා විශාල අර්බුදයක්ද පැන නැගුණා.

ඒකි පසුබිම යටතේ 1864 බද්දේගමදීද, 1866 උදන්විටදී ද, 1871 ගම්පොළදීද, 1873 පානදුරේදීද, 1880 මහනුවර දීද, 1899 ඌරුගොඩ වත්තේදීද, බෞද්ධ , ක්‍රිස්තියානි ගිහි පැවිදි වියත්හු වාද පැවැත්වුවා. මේ අතරින් පානදුරේ පැවති වාදයට අන්තර් ජාතික මට්ටමේ ප්‍රසිද්ධියක් ලැබුනා. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියෝ බෞද්ධ පාර්ශ්වයේද දාවිත් ද සිල්වා දේවගැතිවරයා කිතුනු පාර්ශ්වයේද මුලිකත්වය ගෙන ක්‍රියා කළා.

ආදර දුවේ පුතේ, මේ ක්‍රිස්තියානි පාර්ශවයෙන් සම්බන්ධවු කවුරුත් කතෝලිකයින් නොවේ. කිසිදු කතෝලික යෙක් මේ කිසිදු විවාදයකට සම්බන්ධ වුනේ නැහැ. නමුත් ඉතිහාසයේ යම් වැරදීමක් නිසා අදත් සමහර අය සිතනවා මේ විවාද පැවැත්වුනේ කතෝලික බෞද්ධ පාර්ශ්වයන් අතර කියා. වෙස්ලියන් සභාවේ දේවගැතිවරු තමයි මේ විවාද වලට සම්බන්ධ වී තිබෙන්නේ.

ඒ ඒ ස්ථානයන්හි ගම් වල පැවති නාමයන් පසුබිම් කරගෙන එම පංච මහා වාද ප්‍රසිද්ධ වී තිබෙන අතර බෞද්ධ - ක්‍රිස්තියානි ආගම් වල ප්‍රධාන සිද්ධාන්ත සම්බන්ධ කරගෙන ප්‍රසිද්ධ දේශනා පවා මෙකී ස්ථාන වල පවත්වා තිබෙනවා. ඒ වගේම එම වාද ඇතුළත් කර කෘති රාශියක්ද පළ කර තිබෙනවා. බද්දේගම වාදය, උදන්විට වාදය, ඇතුළු පොත් කිහිපයක් ගැනද, පංච මහා වාදය නමින් සහ පානදුර වාදය නමින් විවිධාකාර හැඩ ගත් ග්‍රන්ථයන්ද පසු කළෙක මුද්‍රණය වී තිබෙනවා. මේ වාද ශ්‍රවණය කිරීමට පැමිණි පිරිස මහත් වු බවද කියැවෙනවා. කිසිදු කල කෝලාහලයක් මේ වාද නිසා ඇති වූ බවද සඳහන් නොවේ. ඒ ඒ කථිකයින් දේශන පවත්වා අවසන් වූ විට බෞද්ධ පිරිස ප්‍රීති ඝෝෂා පවත්වා ඇති අතර ක්‍රිස්තියානි භක්තිකයෝද ප්‍රීති ඝෝෂා පවත්වා ඇත. මේ වාද මෙලෙස අතීතය තුළ සිදු වී ඇත්තේ අවබෝධයට වඩා අනවශ්‍ය ලොල් බවකින් එකිනෙක විශ්වාසයන් වෙතට ගිය පිරිස් නිසා බවද සඳහන් වෙනවා. මේ වාද පිටියට සපැමිණි අය අතර බෞද්ධ පාර්ශ්වය වෙනුවෙන් මොහොට්ටියාවත්තේ ගුණානන්ද හිමි හික්කඩුවේ සුමංගල , බුලත්හට ධම්මාලංකාර , රත්මලානේ ධම්මාලෝක, වැලිගම සුමංගල. වස්කඩුවේ සුභූති යන හිමිවරුන්ද බටුවන්තුඩාවේ පඬිතුමාද එක්වු අතර ක්‍රිස්තියානි පක්ෂය වෙනුවෙන් ගුණවර්ධන ජයසිංහ, චාර්ල්ස් ද සිල්වා සහ දාවිත් ද සිල්වා යන දේව ගැතිවරුන් සමඟ සිරිමාන්න නම් කථිකයෙක්ද සහභාගි වු බව ඉතිහාස ගත ලේඛනවල සඳහන් වෙනවා.

වෙස්ලියානු සභාව මුල් කොට මේ දේවගැතිවරුන් සහභාගි වී ඇති අතර ශ්‍රී ලංකාව තුළ කිසිම කතෝලිකයෙකු ආගම නිසා හරසුන් විවාද වලට අතීතයේදී මෙන්ම මෑත අතීතය තුළද සහභාගී වී නොමැත. එම නිසා මේ පංච වාද වලට කතෝලික සහභාගීත්වයත් සහයෝගයත්, දයකත්වයත්, කැමැත්තත් නොතිබු බව ඉතිහාසය ගැන ලියන අය සහ කථා කරන අය දැන ගත යුතු බව පුංචි ඔබත් පුන පුනා පවසන්න. නිවැරදි ඉතිහාසය දැන ගන්න. ඒ ගැන ලියන්න.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# භාග්‍යවරයට පත් කවුන්සිලයේ පාප්තුමා

**පසුගිය සතියෙන්**



ක්‍රි.ව. 1944 දී ලුයිජි කාදිනල් හිමි ස්වර්ගස්ථ වීමෙන් පසුව, මොන්ටිනි පියතුමා තම කාර්යය සෘජුවම දොළොස්වන පියුස් පාප් වහන්සේ යටතේ කරගෙන යන්නට විය. දෙවන ලෝක යුද්ධ සමයේදී විවිධ දේශපාලන බලපෑම් හමුවේ වුවද, පාප්තුමන්ගේ අනු දැනුම මත මොන්ටිනි පියතුමා යුද්ධයෙන් බැට කෑ අසරණ වූ පුද්ගලයන් සඳහා විශාල වශයෙන් සහන සේවාවන් සංවිධානය කළේය. ක්‍රි.ව. 1952 දී අති උත්තම දොළොස් වන පියුස් පාප් වහන්සේ රහසින් පවත්වන ලද කාදිනල් සංසදයකදී මොන්ටිනි හා ඩොමිනිකො තාර්දිනි යන පියවරුන් හට රතු හිස් වැසුම් පළඳනා ලබා දී කාදිනල් ධුරයට උසස් කිරීමට අදහස් කළත්, ඔවුන් ඉතා ගෞරවයෙන් එය නොපිළිගත් තැන ශුද්ධෝත්තම පියතුමා ඔවුන්ව සම වතිකානු රාජ්‍ය ලේකම්වරුන් වශයෙන් නම් කරන ලදී.

ක්‍රි.ව. 1954 දී අති උත්තම දොළොස්වන පියුස් සසුන් පියා මොන්ටිනි පියතුමාව මිලාන්හි අගරදගුරුතුමන් ලෙස පත් කළේය. ඒ හා සමඟම නිරායාසයෙන්ම එතුමන් ඉතාලි රදගුරු මඬුල්ලේ ප්‍රකාශකයා බවටද පත් විය. මොන්ටිනි පියතුමාගේ රදගුරු අබිසෙස් උළෙල කාදිනල් මණ්ඩලයේ ප්‍රධානියා වූ කාදිනල් තිසරන්ට් හිමිපාණන් අතින් සාන්ත පීතර බැසිලිකාවේදී පැවැත්වුණේ ඒ වන විට අති උත්තම දොළොස් වන පියුස් පාප්තුමා තරමක අසනීපයෙන් පසු වූ නිසාය. මිලාන් අගරදගුරු පදවිය ඉතාලියේ තිබෙන විශාලතම අගරදගුරු පදවියයි. දෙව්මැඳුරු විශාල සංඛ්‍යාවකින් ද ගරු පියවරුන් විශාල සංඛ්‍යාවකින් හා කතෝලික බැතිමතුන් විශාල සංඛ්‍යාවකින් ද යුත් මිලාන් අගරදගුරු පදවිය සාමාන්‍යයෙන් පැවතුනේ කාදිනල් තුමෙකු යටතේය. නමුත් මොන්ටිනි පියතුමා මිලාන් පදවිය බාර ගන්නා විට රතු හිස් වැසුම් ලබා නොතිබුණි.

මිලාන්හි අගරදගුරු හිමිපාණන් ලෙස මොන්ටිනි හිමි තම පදවිය ප්‍රතිසංවිධානය කළේය. කතෝලික අධ්‍යාපනය නඟා සිටුවීමට ක්‍රියා කළේය. සුභාරංචිය දසත පතල කිරීමට වෙහෙසුනේය. වැඩ කරන ජනතාව නැවතත් සභාවට දිනා ගැනීමට ක්‍රියා කළේය. දිනෙන් දින එතුමන්ගේ කීර්තිය තව තවත් සභාව තුළ පැතිර ගියේය. මේ අතරතුර ක්‍රි.ව. 1958 දී අති උත්තම දොළොස් වන පියුස් පාප් වහන්සේ ස්වර්ගස්ථ වුයෙන් එතුමන්ගේ අනුප්‍රාප්තිකයා වශයෙන් කාදිනල් හිමිවරුන් අතර පැවති රහස් ඡන්දයෙන් තේරී පත් වුයේ වැනිසියේ අග්‍ර පීතෘව සේවය කළ කාදිනල් රොන්කල්ලි හිමිපාණන්වය. එතුමෝ විසිතුන්වන ජුවාම් නමින් ශුද්ධාසනය බාර ගත්හ.

අති උත්තම විසිතුන් වන ජුවාම් පාප් වහන්සේ ක්‍රි.ව. 1958 දෙසැම්බර් 15 වන දින පැවැත්වූ සිය පළමු කාදිනල් සංසදයේදීම කාදිනල් ධුරයට ඔසවන ලද සභා පියවරුන් විසිතුන්දෙනා අතර මොන්ටිනි අගරදගුරු හිමිගේ නාමය ඉහළින්ම තිබුණි. ක්‍රි.ව. 1962 දී සභා නවෝදයකට මුල පුරමින් අති උත්තම විසිතුන්වන ජුවාම් පාප් වහන්සේ දෙවන ජගත් වතිකානු කතිකාවත කැඳවන ලදී. දෙවන ජගත් වතිකාන කතිකාවත සඳහා සුදානම් වීමේ කොමිසමේ හා එහි තාක්ෂණික සංවිධාන කොමිසම තුළදී වැඩකටයුතු කිරීම සඳහා පාප්තුමන් විසින් මොන්ටිනි කාදිනල් හිමිපාණන් පත් කරන ලදී.

ක්‍රි.ව. 1963 ජූනි 03 වන දින දෙවන ජගත් වතිකාන කතිකාවත පැවැත්වෙමින් තිබෙන අතරතුර ජුවාම් පාප් වහන්සේ ස්වර්ගස්ථ වුයෙන්, නව සසුන්පති පදවිය සඳහා කාදිනල් හිමිවරුන් අතර පැවති රහස් ඡන්දයෙන් තෝරා පත්කර ගැනුනේ මිලාන්හි අගරදගුරු හිමිව කටයුතු කළ කාදිනල් මොන්ටිනි හිමිපාණන්වය. සකල ලෝකයා වෙත සුභ අස්න ගෙන යාමේ තිර අදිටනින් "පාවුළු" යන නාමය තෝරා ගනු ලදුව එතුමා 'හයවන පාවුළු' නමින් ශු. පේදුරු තුමන්ගේ දෙසිය හැට දෙවන අනුප්‍රාප්තිකයා වශයෙන් ශුද්ධාසනය බාර ගත්තේ පූර්ණ ඔටුනු පැළඳවීමේ මංගල්‍යයක් සමගිනි. එතුමන්ගේ ආදර්ශ පාඨය වුයේ **"Cum Ipso in monte In nomine Domini" ( With him on the mount in the name of the Lord)** යන්නයි.

සසුන් නිතීයට අනුව ශුද්ධෝතතම පියතුමෙකු ස්වර්ග ස්ථ වීමත් සමඟ මන්ත්‍රණ සභාවද අවසාන විය යුතුය. නමුත් අති උතුම් හයවන පාවුළු පාප්තුමා සාන්ත ජුවාම් පාප්තුමාගේ දෙවන ජගත් වතිකාන කතිකාවත ඉදිරියට කරගෙන යාමට තීරණය කළේය. ඒ ප්‍රධාන අරමුණු හතරක් පෙරදැරි කර ගෙනය.

1. කතෝලික සභාව පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා දීම.
2. කතෝලික සභා ප්‍රතිසංස්කරණ ඇති කිරීම.
3. ක්‍රිස්තියානි සභාවන් අතර සුහදතාවය වර්ධනය කිරීම.
4. ලෝකය සමඟ විවෘත සංවාදයකට පිවිසීම.

ඉදිරියට ....

දිනේෂ් පෙරේරා - දළුගම



කැපුන්ගොඩ මීසමට අයත් දුන්ගල්පිටිය ශු. මරිය මග්දලේනා දහම් පාසලේ ළමෝ 31 ක් පසු ගියදා ප්‍රථම වරට දිව බොදුන් ලැබුහ. මීසම් සේවක, ගරු ක්ලෝඩ් වනසිංහ, දුන්ගල්පිටිය නේවාසික ගරු අරුනෝද පියතුමන්ලා සමඟ ගරු නිලන්ති පැවිදි සොයුරිය දහම් ගුරු මඬුල්ල ළමුන් සමඟ ළමා ප්‍රදීපය කැමරාවට මුහුණ දුන් අයුරු. **සේයා :- ස්ටැන්ලි ප්‍රනාන්දු / සටහන :- සෙබස්තියන් පෙරේරා**






කිරිමැටියාන ශු. ජෙරාඩ් මජෙල්ලා දේවස්ථානයේ දරු දැරියෝ 22 ක් පසු ගියදා ප්‍රථම වරට දිව බොදුන් ලබා ගත්හ. මීසම් සේවක ගරු මේරියස් ෂෙල්ටන් පියතුමා සමග ළමුන් ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයට පෙනී සිටි අයුරු.

**සේයා - ඇලෙක්ස්**
**සටහන - ප්‍රැන්සිස් චාල්ස්**



දලුගම ශා. ෆ්‍රැන්සිස් සාලෙස් දහම් පාසලේ ළමෝ 36 ක් පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. දේව මෙහෙයෙන් පසු මීසම් සේවක ගරු ජුඩ් ශාමන් මීසම් සහයක ගරු රෝෂන් ජනක පියතුමන්ලා, ගරු පැවිදි සොහොයුරියන් දහම් ගුරුහවතුන් හා ළමුන් සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු.

සටහන :- **සංජුල ජනිත**
**සේයා- ඉසුරු ඩී අල්විස්**

# තවත් සාන්තුවර චරිත පොත් දෙකක් ......







**කොළඹ කතෝලික මුද්‍රණාලය මගින් ප්‍රකාශයට පත් කරන ලද "කොපර්ටිනෝහි සාන්ත ජෝසප් මුනිතුමා", (සුගිත් නිරංග මහතා ලියු). "ශුද්ධවූ පේදුරු අපෝස්තුලු තුමා" (ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමා ලියු). සාන්තුවර චරිත ග්‍රන්ථ නිකුත් වී ඇත. මිල රු.30 කි. කොළඹ කතෝලික මුද්‍රණාලයට අනුබද්ධිත කොළඹ කතෝලික පොත්හලෙන් මෙම පොත් මිලදී ගත හැකිය.**

## විශිෂ්ට සම්මාන ලබයි.



කඳාන ද මැසිනොද් විදුහලේ ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය මගින් සංවිධානය කළ "පන්හිඳ" නව නිර්මාණ කරුවන්ගේ පොත් ප්‍රදර්ශනය පසුගියදා විදුහලේ "සොඳුරු පීඨයේදී" පැවැත්විණි. සිසු සිසුවියන්ගේ නිර්මාණ 1052 එදින එළි දැක්වුණු අතර විශිෂ්ටතම නිර්මාණ 50 කට කුසලතා සහතික හිමිවිය. එහිදී 05 ශ්‍රේණියේ ඉගෙනුම ලබන පසිඳු නිර්මාල් සිසුවා විසින් රචිත "කළු කැළයේ අළුත් යාළුවා" හා "පුංචි අපට ළමා කතා"යන කෘති වලට විශිෂ්ට කුසලතා සහතික හිමිවිය.

## ජාත්‍යන්තර පදක්කම් දිනූ කරාතේ ක්‍රීඩිකාව

**දිළෙන මිණි මුතු**



කරාතේ ක්‍රීඩාව තුළින් ජාත්‍යන්තර තරඟාවලියකින් ජය ලබා ලක් මවට කීර්තිය අත්කර දුන් දියණියකගේ තොරතුරු මෙවර දිළෙන මිණිමුතු ඔස්සේ ඔබට කියමි. ඈ නමින් කේ. හෂිශානි ඒන්ජල් ප්‍රනාන්දුය. දළුපත මීසමේ පල්ලන්චේන වෙලන්කන්නි ආරෝග්‍යමාතා දහම් පාසලේ සිසුවියක වන හෂිශානි බෝලවලාන ආවේමරියා කන්‍යාරාමයේ 10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන දීප්තිමත් ශිෂ්‍යාවකි.

කුඩාකල සිටම කරාතේ ක්‍රීඩාවට ඇළුම් කරන ඇය මේ වනවිට "ෂෝටෝකාන් රියු කරාතේ දේ නිසෙයිකායි" සංගමයේ පුහුණුව හදාරමින් ඒ තුළින් ජයග්‍රහණ රාශියක් දිනා ගනිමින් තම මීසමට, විදුහල් මාතාවට ලක්මවටත් කීර්තිය අත්කරදී ඇත. 2013, 2014 බස්නාහිර පළාත් ශූරතාවලියේ පිට පිටම ප්‍රථම ස්ථානයත්, 2014 ශ්‍රී ලංකා ජාතික ශූරතාවලියේ කාතා සහ කුම්තේ ඉසව් වලින් ප්‍රථම ස්ථානය හා 2014 ශ්‍රී ලංකා GIKO විවෘත ශූරතාවලියේ ප්‍රථම ස්ථානය ඇතුළු මුල්පෙළේ ජයග්‍රහණ රැසක් දිනා ඇත. පසුගියදා ඉන්දියාවේ ගොවේ ප්‍රදේශයේ පැවති SKSI'S ජාත්‍යන්තර කරාතේ ශූරතාවලියේ වයස අවුරුදු 15 න් පහල තරඟ ඉසව්වේ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් කාතා ඉසව්වෙන් රන් පදක්කමත්, කුම්තේ ඉසව්වෙන් ලෝකඩ පදක් කමත් දිනා ගනිමින් ලක් මාතාවට ගෞරවය අත්කර දෙන්නට සමත්විය.

තමන්ව දිරිමත් කල සියළු දෙනාහට ස්තුතිය පුද කරන්නට ඇය අමතක නොකලාය. දෙවි සමිඳුණන්ට ප්‍රථමයෙන් ස්තුතිය පුදකරන ඈ තම දෙමාපියන්ට , බෝලවලාන ආවේ මරියා කන්‍යාරාමයේ විදුහල්පතිනි ගරු සිරිමා ඕපනායක පැවිදි සොයුරිය ඇතුළු ගුරු මණ්ඩලයටද, කරාතේ ක්‍රීඩාව තුළ ඉහලට රැගෙන ගිය ෂෝටෝකාන් රියු කරාතේ සංගමයේ ශ්‍රී ලංකා ශාඛාවේ නියෝජිත හා ප්‍රධාන උපදේශක එම්.එෆ් ජ්ලිමන් සුභසිංහ මහතාටත්, මෙත්මාත් , ඩිල්ෂාන්, චරක, ඇතුළු සියළුම ගුරු පියවරුන්ටත් සිය ස්තුතිවය පුදකර සිටියි. හෂිශානි දියණියට ක්‍රීඩා අංශයෙන් ඉදිරියට යෑමට ළමා ප්‍රදීපය සුබ පතමි.

**ඩබ්.ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු**

## රූපවාහිනිය

දිනෙන් දින දියුණු වන ලෝකය අපට විශ්වගම්මානයක් ලෙස හැඳින්විය හැක. එයට හේතුව සංවර්ධනය කරා යන රටවල් අතර ශ්‍රී ලංකාවත් සිටීමයි. රූපවාහිනිය යනු ශව්‍ය දෘෂ්‍ය මාධ්‍යකි. ලෝකයේ ඇති සියලු දේම යහපත් හා අයහපත් යන අංශ දෙකටම අයත් වේ. එහිදී යහපත් දේ තෝරා ගැනීම අපගේ වගකීමයි.




යහපත් දේ තෝරා ගැනීමේදී අපට විවිධ ප්‍රශ්න , දුක් කම්කටුලු වලට මුහුණ දීමට සිදුවුවත් හෘද සාක්ෂියට එකඟව එය තෝරා ගැනීම අප සතු යුතුකමයි. වර්තමාන ලෝකයට මෙම සංවර්ධනය බාධකයක් වී ඇත්තේ අප එය භාවිතා කරන ආකාරයයි. සමාජයේ කුඩාම ඒකකය වූ පවුල තුළ තිබූ ආදරය , සමගිය, මිත්‍රත්වය වර්තමානයේ දක්නට නොමැත. අප සියලු දෙනා රූපවාහිනිය මඟින් අපගේ ජීවිතයට අරුතක් එක් කරන අධ්‍යාපනයට රුකුලක් වන වැඩසටහන්ද විකාශය කෙරේ. මෙහිදී අපි හොඳ දෙයින් හොඳම දේත් , හොඳම දේයින් ඉතාමත් හොඳ දේත් තෝරාගත යුත්තෙමු.

**කිත්මිනි සජානි** - 08 ශ්‍රේණිය - **සිරිකුරුස විදුහල - ගම්පහ**

# ළමා සිතිවිලි



## නවීන තාක්ෂණය

එදිනෙදා ජීවිතයේ වැඩකටයුතු පහසු කරගැනීමට තාක්ෂණය මනා පිටිවහලක් වී හමාරය. නවීන තාක්ෂණයේ දියුණුවත් සමඟම අද සමාජය විශාල වෙනසකට භාජනය වී තිබේ. මේ වන විට මිනිසා පවා නවීකරණයකට පත්වී ඇත. තාක්ෂණය අපට ප්‍රයෝජනවත් වනු සේම එයින් ලැබෙන අයහපත් ප්‍රතිඵලද රාශියකි. වැඩිහිටියන්ට ගරු කිරීම, තම ආගමට දහමට ගරු කිරීම වැනි සාරධර්ම එදා සමාජයේ බහුලව භාවිතා කරනු ලැබුවත් තාක්ෂණයේ දියුණුවත් සමග අද සමාජය දෙස බලන විට සාරධර්ම වලින් පිරිහීගිය නොමිනිස්කම් වලින් පිරි මිනිස් කොට්ඨාශයක් බිහිව ඇත. සෑම අංශයකම දියුණුවට තාක්ෂණය හේතු වී තිබෙන බව පැහැදිලිය. එසේම තාක්ෂණයේ අහිතකර බලපෑම් වලට මිනිස් ජීවිත විනාශයට පත් කිරීමට හැකිවී තිබෙනවා. කුඩා දරුවෙකු පවා අසභ්‍ය දේ වලට යොමුවීමට ඇති ඉඩකඩ අසීමිතය. මේ නිසා තම ජීවිතය පවා විනාශ කරගැනීමට තරම් දරා ගත නොහැකි මානසික පීඩන වලින් යුතු දරුවන් බොහෝය. අන්තර්ජාලය ඔස්සේ අධ්‍යාපනයට ලබා ගත හැකි බොහෝ දේ ඇත. එමගින් තරඟකාරී ලෝකය හා එක්ව කටයුතු කිරීමට අවස්ථාව සැලසේ. එසේම ඒවායේ ඇති අසභ්‍ය තොරතුරුද බොහෝ හානිකරය. තාක්ෂණයෙන් යහපත් ප්‍රතිඵල වැඩිවැඩියෙන් ලබා ගෙන අයහපත් දේ අප තුළින් ඉවත් කිරීමට උත්සහ ගනිමින් ජීවිතය සාර්ථක කර ගැනීම අප සතු යුතුකමක් හා වගකීමකි.

**තිලිණි හංසිකා**
10 ශ්‍රේණිය - **ශා. ඇලෝසියස් දහම් පාසල - රඹුක්කන**

## ළමා ඔබට සාමාන්‍ය දැනීම

- **බඹරකන්ද ඇල්ල අයත්වන ඔය කුමක්ද?** නානුඔය
- **යාන්ඔය ආරම්භ වන්නේ මොන කඳුවැටියෙන්ද?** සීගිරි කඳුවැටියෙනි
- **යාන්ඔය මුහුදට වැටෙන්නේ කොහෙන්ද?** පුල්මුඩේ
- **පිදුරුතලාගල කන්දේ උස කොපමණද?** මී. 2525 කි
- **කිරිඳිඔය පාදක කර ගෙන ඉදිකල ජලාශය වන්නේ කුමක්ද?** ලුණුගම් වෙහෙර
- **හැඩ ඔය ආශ්‍රිතව ඉදිකල ජලාශය වන්නේ කුමක්ද?** මුතුකණ්ඩිය
- **මහවැලි ගඟේ දිග ආසන්න වශයෙන් කිලෝමීටර් කීය?** කි.මී 340 යි
- **ශ්‍රී ලංකාවේ කඳු අතුරින් උසින් දෙවනි ස්ථානය ගන්නා කන්ද කුමක්ද?** කිරිගල්පොත්ත
- **රන්දෙණිගල ජලාශයට කිට්ටුම නගරය කුමක්?** මහියංගනය

(පොතපත ඇසුරිනි)

**මැක්සිමස් රෝයි පෙරේරා මාමා**



මීග/පමුණුගම මහ විදුහලේ 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය ඉහලින් සමත් වූ අනුප සේමින්ද, අංජලි සත්සරනි, දුලිෂා නවමිණි, මනෝෂි ප්‍රසාදිනි යන ළමුන් ප්‍රාථමික අංශයේ විදුහල්පතිනි කාන්ති රුදිගු, ගුරුභවතුන් සමග සමූහ සේයාරුවකට පෙනි සිටි අයුරු. **බෙන්ජමින් කිරිහෙට්ටි**

## ඉකිබිඳුම



වෙනදා මෙන් ඉර පෑව්වා කොස්ලන්දට
හැබැයි ඒ ඉර වෙනදා වගෙ නොවෙයි,
මොකක්දෝ වෙනසක් තිබුණා......
දරාගන්න බැරි සීතලේ ලගි ලගියේ ලක ලෑහැස්ති වුණා
පොඩිත්තෝ වැද වැටුණා මව්පියන් පාමුල.....
අකුරට යන්නට මත්තෙන්....
ඒත් උන් දන්නෑ මේ වදින්නේ අන්තිම වරට බව.......
ගේ පිටිපසසේ මහ කන්ද බලා හිටියා වෙනද වගේම
මහා යෝධයෙක් වගේ .........
දොරේ ගලා යන මහ වරුසාව මැද්දේ
සිත් පිත් නැති මහ කන්ද යට කළා මුළු ගමම
එක් නිමේෂයකින් .......
ඒ කන්දට යටවුණේ අපේ ගේ දොර
පමණක් නොව, ආයේ කවදාවත්ම නොලැබෙන
අපේ මව්පියන්ගේ ආදරණීය සෙනෙහසයි......
ආදරණීය උණුසුමයි ......
කොපමණ වෙහෙසුනද ගොඩගත හැකිද
වැළලී ගිය ඒ මව්පිය සෙනෙහස..........

**අයිරෝමි පෙරේරා (ආචාර්ය මඩුල්ල)**
සිරිකුරුස විදුහල - ගම්පහ

## බදුල්ල පදවියේ දේව කැඳවීම් කඳවුරක්



බදුල්ල පදවියේ හපුතලේ සා. එමාර්ඩ් දෙව්සත්හලේ දී තෙදිනක දේව කැඳවීම් කඳවුරක් පැවැත්වුණි. දෙව්සත්හලේ අධ්‍යක්ෂ ගරු යොහාන් ප්‍රනාන්දු පියතුමා මෙම කඳවුර සංවිධානය කළේය. මීට එක්වූ ළමුන් සේයාරුවකට පෙනී සිටි අයුරු. **ශ්‍රීකාන්ති ගුණවර්ධන - බදුල්ල**

## මළවුන්ගේ මාසයේදී පුංචි මතක් කිරීමක්



ආදර දුවේ, පුතේ, නොවැම්බර් මාසය අපි කවුරුත් දන්නවා මළවුන් සිහිකිරීමට වෙන්කර තිබෙන බව. නොවැම්බර් මාසයේ බොහෝ ගෙවල්වල මළවුන් සිහිකර දාන ධර්ම දෙනවා. පුංචි ඔබත් පසුගිය 2 වන දා ''මළවුන්ගේ දිනයේදී'' මළවුන් වෙනුවෙන් දිව්‍ය පූජා යාගයට සහභාගි වුන නේ. වෙනදා කැළෑ වැදිලා තිබුන මිනී පට්ටනිය පිරිසිදු කරලා තියෙනවා ඔබ දකින්න ඇති. මේ මාසයේදී බොහෝ දෙනෙක් තම තමන්ගේ මියගිය අයගේ මිනී වළවල් ළඟ ඉටිපන්දම් පත්තු කරලා, මල් තියලා යාච්ඤා කරනවා. ආදර දුවේ, පුතේ, අපේ මියගිය අයව සමරන්න අපට මතක් වෙන්නේ නොවැම්බර් මාසයේදී විතරක්ද? වැඩිහිටි ලෝකයේ බොහෝ දෙනෙකුට මියගිය තම තමන්ගේ අයව සිහිපත් වෙන්නේ ටික කාලයකටයි. ඒත් දුවේ, පුතේ, අපි අමතක කරන්න හොඳ නෑ, අපේ මිය ගිය අයගේ ආත්ම වගේම කිසිම කෙනෙකුගේ පිහිටක් නැතිව දෙව් පියාණන්ගේ දර්ශනය දැක ගන්න බැරිව දුක් විඳින ආත්මයන් විශාල ගණනක් ශුද්ධිකාග්නිස්ථානයේ රැඳී ඉන්න බව.

දිව්‍ය පූජා වේලාවේදී පියතුමා මියගිය අය සිහිපත් කරමු කියලා කියනවා. ඒ වේලාවේදීත් පියතුමා නම් සඳහන් කරන මියගිය අයට වගේම ශුද්ධිකාග්නස්ථානයේ පිහිටක් නැතිව සිටින ආත්මයන් සිහිපත් කර යාච්ඤා කිරීමට අපි බැඳී ඉන්න බව අමතක කරන්න එපා. සමහර විට ඔබේ අම්මා හෝ තාත්තා මිය ගොස් වෙන්න පුළුවන්. ඔබේ අක්කා, අයියා, නංගි, මල්ලි, ආච්චි, සීයා, නෑදෑයෝ මියගොස් ඇති. මේ හැම කෙනෙකු වගේම සමහරවිට ඔබේ පවුලේ අය සමඟ අමනාපව සිටි මියගිය අසල්වැසි අය ඉන්න පුළුවන්. මේ හැම කෙනෙක්ම දෙව් පියා ළඟට යන්න ඕන. මළවුන්ගේ මාසයෙදී විශේෂයෙන් යාච්ඤා කිරීම දිව්‍ය පූජා සිදු කිරීම ඉතාමත් උතුම් ක්‍රියාවක්. ඒ වගේම දාන ධර්ම දීම ඒ වගේම උතුම්. මා ආදර දුවලා පුතාලට විශේෂයෙන් කියන්න ඕන, මියගිය අයට කාගෙන්වත් පිහිට ඉල්ලන්න බැහැ ශුද්ධිකාග්නිස්ථානයෙන් මිදිලා දෙව් පියාණන් වෙතට යන්න. ඔයාලා අපි තමයි, ඒ අයට උදව් කරන්න ඕන. ඒ නිසා මළවුන්ගේ මාසයේ විතරක් නොවෙයි, දිනපතා අපේ යැදුම්වලදී මියගිය අයව සිහිකර යාච්ඤා කරන්න. පිහිටක් නැති ආත්මයන්ට සැනසුම ලැබෙන්නට දෙව් පියාණන්ට යාච්ඤා කරන්න.

**ටෙක්ලා කල්දේරා නැන්දා**

# කඳාන මීසමේ ධර්මදූත ළමා සමාජයන්හි දක්ෂ ලේඛකයෝ

## ජේසු අම්මේ

ජීවිතයේ තනි වෙද්දි
දුක් බාධක වැඩිවෙද්දී
ඔබේ පිහිට සුවඳ දිදී
දැනුනා මට ජේසු අම්මේ.........

ඉර බැස යන සවස් කාලයේ
ජපමාලය අතට අරන්
කිය කිය ඔබේ මුහුණ බලන් ඉන්නා විට
සතුටක් දැනුනා ජේසු අම්මේ........

**විමුක්ති රුචින්තක**
**07 ශ්‍රේණිය**
**පිරිසිදු දේව මාතා ධර්මදුත ළමා සමාජය**
**කඳාන**



## සරුංගලය



ඉරටු දෙකක් බැඳි නූලේ
සව් කඩදහි අලවන්නේ
සුළං සැරේ උඩ යන විට
ඇතිවෙයි හැමටම ආලේ

සුළඟින් උඩ නඟිනවා
සරුංගලය නටනවා
තවත් උඩට යන්න නොදී
නූලෙන් මා අඳිනවා

**මධුෂානි ප්‍රනාන්දු**
**09 ශ්‍රේණිය**
**ජේසු කුමරු ධර්මදූත ළමා සමාජය - කඳාන**

## වැඩමුළුවක ප්‍රතිඵලයක්



**හිරුණි කරුණාරත්න**
**09 ශ්‍රේණිය**
**සැනසිලිදයක ධර්මදුත ළමා සමාජය**
**කඳාන**



**ඉමාන් වෙනුර**
**0 ශ්‍රේණිය**
**සැනසිලිදයක ධර්මදුත ළමා සමාජය - කඳාන**




**ශනෙල් දිලීෂක**
**04 ශ්‍රේණිය**
**එකමුතු ධර්මදුත ළමා සමාජය - කඳාන**



## ආදර ගුරු මව්නි

අපට ජේසුගේ මාර්ගය පෙන්වා හොඳ නරක කියාදී යහමඟ පෙන්වා දෙමින් හොඳ ධර්මදූත දරුවෙක් කරන්නට ගන්නා උත්සහයට ඔබට ස්තූතියි. ඔබට දේව වරප්‍රසාද බහුලව ප්‍රාර්ථනා කරමි.

**සයුරි අප්සරා**
**05 ශ්‍රේණිය**
**එකමුතු ධර්මදුත ළමා සමාජය - කඳාන**

## ළමා ලේඛක වැඩමුළු

### කොළඹ පදවිය

මීගමුව දිසාවේ ධර්මදූත ළමා සමාජයන්හි ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් 2014 නොවැම්බර් 22 වන සෙනසුරාදා දින මුන්නක්කරය සිරිකුරුස දේවස්ථානයෙන්දී පැවැත්වේ.

මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. ළමුන්ගේ ලේඛන කුසලතා එළිදැක්වීමේ අරමුණින් යුතුව මීගමුව දිසා ධර්මදූත ළමා සමාජ අධ්‍යක්‍ෂ, මහවීදිය මීසම් සහයක ගරු නලින් සුරාජ පියතුමාගේ අනුශාසකත්වයෙන් මීගමුව දිසාවේ සජීවක සජීවිකාවන්ගේ සහයෝගයෙන් මෙය සංවිධානය කරයි. **ප්‍රියංගිකා රොෂාරි**

## පිය සෙනෙහස



දස මසක් කුස දරා මා මොලොවට නොවැදුවත්
ඇඟලේ කිරි කැටි කොට මා හට නොපෙව්වත්
සැමවෙලේ මා තුරුලෙ නොසිටියත්
පියේ ඔබේ ගුණ කඳ මහ පර්වතයක්

අම්මා සඳකි ඇය මතු බුදු වේය ලොවේ
කීවත් සැමදෙනා සිටිනා අපගෙ ලොවේ
සිතුවේ නෑ කිසිවෙක් කිසිදා සිතුම් ලොවේ
පියගුණ තරම් නැත කිසිවක් සතර ලොවේ

**නෙත්මි අමායා පෙරේරා**
**9 ශ්‍රේණිය**
**සිරිකුරුස විදුහල - ගම්පහ**

## සුන්දර උදෑසනක්



හිරු කුමරා එබී බලයි
මල් කුමරියෝ සුවඳ හමයි
කුරුලු රැන් පියඹා යයි
උදෑසනේ සිරිය ගෙනෙයි

ගස් වල අතු සෙලවී යයි
සීත සුළං පාවී යයි
සමනලයින් පියඹා යයි
සුන්දර දවසක් ඇරඹෙයි.

**සහනි හිරුෂිකා**
**8 ශ්‍රේණිය - සා. ආනා දහම් පාසල - පළඟතුරය**




## මගේ සිත

සුළඟ වගේ නිදහසේ
ගමනාන්තය නොදැන සිතු සේ
විටෙක සසලව විටෙක සතුටු ව
ගෙවනා හැම මොහොතකම
ජීවිතේ අරමුණ සොයා යන
මටත් නොදැනි මගෙන් වෙන්වෙන
මටත් වඩා මා ළඟින්ම සිට
විටෙක මට නපුරුව
විටෙක සෙවණැල්ල මෙන්
නිරතුරු මා ළඟින් රැඳෙන
ඔබයි මාගේ එකම මිතුරිය

**දේදූ අතපත්තු**
**11 ශ්‍රේණිය**
**ක්‍රිස්තුරාජාණන්ගේ දහම් පාසල**
**උළුඅම්බලම - (බෝලවලාන මීසම)**

## "සුපිපි මලක් වෙමි මම"

විශ්වයේ මැවුම්කරුවාණන්වූ
දෙවි මහෝත්තමයාණන්ගේ
සුන්දර නිමැවුමකි මල්

මිහිතලය සුවඳවත් කරන
පරිසරය ලස්සන කරන
සුන්දර වස්තුවකි මල්

සන සිත පුබුදුවයි
සැම දෙනයන පිනවයි
මන කුල්මත්කරයි මල්

සමිඳු පුදන්නට ඔබ දෝතේ
සදා සුවඳැති
"සුපිපි මලක් වෙමි මම"

**සෂ්මින් ක්‍රිසෙන්ටා**
**8 ශ්‍රේණිය**
**සදා සරණ දහම් පාසල - කටුනායක**

## නාය යෑම

ළමයින්ට අම්මලා නැතිවුණා
තාත්තාලා නැතිවුණා
ගෙවල් නැතිවුණා
ඒ නිසා අපට දුකයි

**ශෙනාල් ප්‍රනාන්දු**
**1 ශ්‍රේණිය**
**සා. සෙබස්තියන් විදුහල - මොරටුව**

## මගේ ආදර දෙමාපියෝ



දස මස මා ඔබ කුසේ දරා
මා හැදු වැඩු මගෙ අම්මා
ලේ කිරි කරලා මට පොවලා
මා ඇති ඇඩි කළ අම්මා

වෙහෙස මහන්සිය නොබලා
නිදි නොලබා මා දෙස බලමින්
මා වැඩෙනා සැටි දකිමින්
සතුටට පත්වන මගෙ තාත්තා

දෙව් මව් පිහිට ලැබේවා
නිරෝගී සුවය ලැබේවා
දිගුකල් ජීවත්වේවා
මගේ ආදර අම්මා තාත්තා

**සදෙව් ආන්ජලෝ**
**05 ශ්‍රේණිය**
**සා. ආනා දහම් පාසල - මිරිස්වත්ත**

## මගේ ගුරුතුමිය



මගේ ගුරුතුමියගේ නම රැජිණි.
ඇය ඉතා කරුණාවන්තයි.
ඇය අපිට හරි ආදරෙයි.
අපට හොඳින් පාඩම් කියා දෙයි.
මම ගුරුතුමියට ගොඩක් ආදරෙයි.

**සවන්දි වස්සිකා**
**1 ශ්‍රේණිය**
**ක්‍රිස්තුරාජ විදුහල - පන්නිපිටිය**

# Unknown Catholic Saints

## Ss Cosmas and Damian

### *Feast Day - (September 26)*



*A detail from a icon depicting the third-century physician twins*

Kosmas and Damianos, as they are also sometimes called, were third-century Christian martyrs from what is now Turkey whose popularity grew in the later Roman and Byzantine period.

The twin physicians healed the sick in Ayas then in the Roman province of Syria, but refused to accept payment, attracting the nickname Has "Unmercenary". Among their miraculous exploits, they grafted the leg from a recently dead Ethiopian on to another patient's body, an incident portrayed in many portraits of the twins (a feat not ordinarily possi ble, even with 21st-century technology).

When the Diocletianic persecution began in 303 they were arrested and tortured, then hanged on a cross, stoned and shot with arrows,before finally being beheaded. Their three younger brothers, Anthimus, Leontius andEuprepius, were also murdered.

Their cult grew throughout the fourth century, with churches dedicated to the twins in Egypt, Jerusalem and modern-day Iraq.

Their relics were buried in Cyrrus, Syria, and Emperor Justinian built a church there in their honour. Justinian attributed his recovery from serious illness to the twins and therefore built another church in his capital, Constantino pie. Their popularity spread thanks to influence of Pope Felix IV (526-530), who re-dedicated the Library of Peace as a Basilica of Ss Cosmas and Damian. Although the church is rebuilt, the frescos still survive.

Although little is known of their actual life, their cult survived whereas many others of the period were forgotten (also sharing this feast day are St Vigilius, St Callistratus arid St Senator, all from the same period). The twins are invoked in the Canon of the Mass, which is why their Wggffl names remain familiar to contemporary Catholics.

The skulls of Cosmas and Damian are reputedly buried at the convent of the Clares in Madrid, where they have been since 1581 when Maria, daughter of Emperor of Charles V, brought them over from Germany. But a rival pair of skulls remains in Bremen. They came into the possession of the kings of Bavaria and throughout much of the 20th century were on display in the city, before buried in the crypt in 1994. There is a third pair of skulls in St Stephen's Cathedral in Vienna, while a church in Venice also claims to have some relics.The twins are the patron saints of doctors and surgeons, and are often depicted holding medical equipment of signs.

They are frequently represented in the logos of medical organisations, including the coat of arms of the British Dental Association. They are also regarded as patrons of children in Brazil and their feast day is commemorated in that country by giving children bags of sweets with the saints' images on them. Brazil's oldest church, built in 1535 in Igarassu, is dedicated to them.

Although their feast day was moved from September 27 to September 26 in 1969 traditionalist Catholics still mark it a day later.

පසුගිය ලිපියෙන්

# දියමන්ති වසරට ළඟා වන නුවර දෙව්සත්හල



දෙව්සත්හලේ නි.ම.නිකායේ සහෝදරවරුන් බාරව සිටියේ කලක් එහි ප්‍රාදේශාධිපති වූ ගරු බිසියෑන් පියතුමා ය. දේව ධර්මය සහ දර්ශන විද්‍යාව හැදෑරීම සඳහා ඉහත සඳහන් නේවාසික පිරිස් මෙන් ම බාහිර සිසු පිරිසක් ද වූහ. මේ පිරිස සිල්වෙස්ත්‍රෝ - බෙනදිකාන නිකායේ පූජක පුහුණුව ලබන සහෝදරතුමන්ය. ළඟපාත "මොන්ටෙෆානෝ" හි පදිංචිව සිට, මෙම සහෝදරතුමන් දිනපතා පාඩම් මාලාවනට සහභාගි වනු වස් දෙව්සත්හලට පැමිණියහ.

දෙව්සත්හල විවෘත කිරීමේ උත්සවය එදින, හෙවත් 1955 සැප්තැම්බර 10 වැනි දා ඉතා උත්කර්ෂවත් ලෙස ආරම්භ වූයේ දෙව්මැඳුර තුළ පවත්වන ලද දිව්‍ය පූජාවෙන් ය. අති උතුම් තෝමස් කුරේ අගරදගුරු (එවකට) හිමිපාණන් ගේ ප්‍රධානත්වයෙන් එය පවත්වන ලදි. පැමිණ සිටි රදගුරු හිමිවරු සියලු දෙනාම එයට සහභාගි වූහ. එහිදී දේශනය පවත්වන ලද්දේ ත්‍රිකුණාමලේ රදගුරු අති උතුම් ඉග්නේෂස් ග්ලෙනි හිමිපාණන් විසිනි. ඉනික්බිති එවකට ප්‍රධාන රැස්වීම් ශාලාව ලෙස පරිහරණය කෙරුනු "අවුලා මාඤද්ඤද" (මහා ශාලාව) තුළ සියල්ලෝ රැස්වූහ. එදින වැඩකටයුතු ආරම්භ වූයේ දෙව්සත්හලේ ගීතිකා කණ්ඩායම ගැයූ ගීතිකාවෙන් ඉක්බිති ගරු ඩබ්. දොන් සිල්වෙස්ටර් සහෝදර තුමන් (පසුව රදගුරු) විසින් මෙහෙයවන ලද දෙව්සත්හල් වාද්‍ය වෘන්දය පැවැත්වූ සුමිහිරි වැඩසටහනකින් පසුව යි.

මෙහිදී විධිමත් රැස්වීම ආරම්භ කරමින් එවකට නි. ම. නිකායේ ප්‍රාදේශාධිපති අතිගරු ජෙරාඩ් ෆෝටයින් පියතුමා නව දෙව්සත්හල ස්ථාපිත කිරීමේ සන්නස කියවා ප්‍රකාශයට පත් කළේ ය. එසේ ම නව අධ්‍යක්ෂ පියතුමන් එම නිලයට පත් කිරීමේ ලිපිය ද කියවා ප්‍රකාශයට පත් කළේ ය.

නව අධිපති පියතුමා සිය දෙසුමේ දී තමා මේ නිලය ඉතා බැගෑපත්ව පිළිගන්නා බවත් එහෙත් වැඩි කල් නොගොස් මෙහි වගකීම් බාරගෙන කටයුතු කරනු වස් මුළු ආචාර්ය මණ්ඩලය ම දේශීය පූජක පුතුන්ගෙන් ම සමන්විත වනු දැකීම තමන් ගේ අපේක්ෂාව බවත් ප්‍රකාශ කළේ ය. මේ අපේක්ෂාව අද ඉටු වී තිබේ.

අතිගරු සැකට් පියතුමන් ගේ අනුප්‍රාප්තිකයා වශයෙන් ම පත් වූයේ මරිය නිකායේ දේශීය අතිගරු ඩැල්ස්ටන් ෆෝබ්ස් පියතුමා ය. එතුමාගෙන් පසුව පත් වූ අධ්‍යක්ෂ පියවරු සියල්ලෝම දේශීය පියවරු වෙති. අද එහි අධ්‍යක්ෂ ධුරය දරන්නේ අතිගරු එල්මෝ ඩයස් පියතුමා ය. මුළු ආචාර්ය මණ්ඩලය ම දේශීය ගරු පියවරුන්ගෙන් සමන්විත යි.

විවෘත කිරීමේ මංගලෝත්සවය නිම කරමින් සභාව අමතා කතා කළේ අති උතුම් තෝමස් කුරේ අගරදගුරු හිමිපාණන් ය. කතාව නිම කරමින් උන්වහන්සේ ප්‍රතිඥාවක් දුන්හ. තේවත්තේ බැසිලිකා දෙව්මැඳුරේ පුදසුන (අල්තාරය) පිටුපස ඉහළින් තබා ඔටුනු පළඳන ලද දේව මාතා ප්‍රතිමාව ප්‍රථමයෙන් තබන ලද්දේ මට්ටක්කුළියේ කාර්මෙල් කන්‍යාරාම දෙව්මැඳුරේ දීය. එය එතැනින් ගෙනැවිත් ජාතික දෙව්සත්හලේ දෙව්මැඳුරේ පූජාසනය පිටුපස ඉහළින් ඇති ප්‍රධාන බිත්ති කුහරයේ තාවකාලිකව ස්ථාපිත කරනබව ඒ ප්‍රතිඥාව ය.

මෙම ප්‍රතිමා වහන්සේ නුවරට ගෙනා අවස්ථාවට සහභාගි වනු වස් අති උතුම් තෝමස් කුරේ අගරදගුරු හිමිපාණෝ ද එහි පැමිණියහ. බැසිලිකා දෙව්මැඳුර කැපකිරීමත් සමඟ දේවමාතා වහන්සේගේ ප්‍රතිමාවට ඔටුනු පළඳවන ලදි. ඔටුනු පළඳවන ලද්දේ නුවරින් මෙහි වැඩම කරවන ලද එම ප්‍රතිමාවට යි. ක්‍රි.ව. 1972 දී ජාතික දෙව්සත්හලේ පරිපාලන කටයුතු නි.ම.නිකායෙන් ශ්‍රී ලංකා කතෝලික රදගුරු මඬුල්ල වෙත පූර්ණ ලෙස පැවරිණි. එතැන් සිට එක් අධ්‍යක්ෂ පියතුමකු හැර අන් අධ්‍යක්ෂ පියවරුන් සියලු දෙනා ම පදවි පූජකවරුන්ය මෙම අධ්‍යක්ෂ පියවරුන් තිදෙනකු ඇතුළුව එම ආචාර්ය මණ්ඩලයේ නිල දැරූ ගරු පියවරුන් සත් දෙනකු මේ වන විට රදගුරු පත්වීම් ලබා තිබේ. ජාතික දෙව්සත්හල ද අන්තර්ජාතික වශයෙන් පිළිගත් සරසවියකි. රෝමයේ උර්බානෝ සරසවියට අනුබද්ධව දර්ශන ශාස්ත්‍රය සහ දේව ධර්මය පිළිබඳ ප්‍රථම උපාධි පිරිනැමීම සඳහා එය අනුමැතිය ලබා ඇත. මෙම අනුබද්ධ කිරීම් පිළිවෙලින් සිදුවූයේ 1976 සහ 1968 දී ය.

සිසුන් සංඛ්‍යාව වැඩිවීමත් සමඟ පුහුණුව වඩාත් කාර්යක්ෂමව ඉටුකිරීමේ අපේක්ෂාවෙන් නව ගොඩනැගිල්ලක් ඉදිකොට දර්ශනවාදය හදාරන සිසුන් වෙන් කරන ලදි. මෙහි ප්‍රථම අධ්‍යක්ෂ පියතුමා වූයේ අද කුරුණෑගල රදගුරු තැන්පත් අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් ය. ඉකුත් වසර 59 තුළ ජාතික දෙව්සත්හලෙන් ගරු පූජාප්‍රසාදින් වහන්සේලා 1250 ට අධික පිරිසක් දිවයිනට දායාද කර ඇත. මේ අතර 18 දෙනෙක් රදගුරු වරම් දරත්. අද දිවයිනේ සේවාවෙහි යෙදී සිටින පැවිදි නිකායන් දහයකට වැඩි ප්‍රමාණයක පූජක සිසුවෝ ද මෙහි ඉගෙනීම ලබති. ඉතා අලංකාර පරිසරයක පිහිටා ඇති මෙම දෙව්සත්හල මෙ රට කතෝලික පිරිස දෙවිඳුන්ගෙන් ලද මහඟු දායාදයක් බව කිසිදු සැකයක් නැත.

ඉදිරියට.........

**විශ්‍රාමික අගරදගුරු අති උතුම්**
**ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසිනි**



**රෝගීන්ට සුවය දානය කළ ජේසුස් වහන්සේ**

**ෂෙහිනි මරීෂා**

08 ශ්‍රේණිය

ශු. මිඛායෙල් දහම් පාසල - නාලවලාන

**ජේසුස් වහන්සේ බෞතීස්ම ස්නාපනය කිරීම**

**ශෙහාන් ප්‍රමෝද්**

08 ශ්‍රේණිය

ශු. පවුලේ දහම් පාසල - මිල්ලව





**ක්‍රිස්තු රජාණෝ**

**ජේසන් පෙරේරා**

06 ශ්‍රේණිය

ශ්‍රී හෘදයේ දහම් පාසල - මත්තුමගල

## පුංචි අපේ චිත්‍ර පිටුව



**ශ්‍රී ශරීරය හා රුධිරය**

**ක්‍රිස් හිරුන්**

05 ශ්‍රේණිය

සා. තෙරේසා දහම් පාසල - තල්විල

**යහපත් සමරිතානුවරයා**

**රෂිනි හිමාෂා**

08 ශ්‍රේණිය

සදාසරණ දහම් පාසල

විජය කටුපොත

(අඟුණවිල මීසම)





**සැඳෑ අසිරිය**

**විශ්මි මල්ෂා**

10 ශ්‍රේණිය

සිරිකුරුස විදුහල

ගම්පහ

# පූජා සහයක දරුවන්ගේ නාම සාන්තුවර ශා. ජෝන් බර්ච්මන්ස් මුනිතුමා



සුදුවර චරිතයක් හඳුනාගනිමු



වර්ෂ 1599 දී බෙල්ජියමේ සියස්ට් ග්‍රාමයේ සපතේරුවකුගේ පවුලක කුළුඳුල් දරුවා ලෙස උපත ලැබූ මෙතුමා, කුඩා කල සිටම පියතුමකු වීමට දැඩි ආශාවක් දැක්විය. ඔහුට පසුව තවත් සහෝදර යෝ දෙදෙනෙක් පවුලට එකතු විය. වයස අවුරුදු 13 ක් වන විටම නිවසේ පැවති ආර්ථික අපහසුතා නිසා පුංචි ජෝන්ට රැකියාවක නිරත වීමට සිදුවිය. මෙසේ ඔහුට රැකියාව කිරීමට සිදුවූයේ මාලින් නගරයේ පිහිටි ආසන දෙව්මැඳුරේ නීති සම්පාදනය කරන්නෙකුගේ නිවසේ මෙහෙකරුවෙකු ලෙසය. මවගේ මරණයෙන් පසු එකල පැවති නීතිය අනුගමනය කරමින් පියා සහ සොහොයුරන් දෙදෙනා සමඟ පැවිදි දිවිය වැළඳ ගන්නා ලදී. 1615 දී ජේසු නිකායික විද්‍යාලයට ඇතුළත් වී, වසරක් ඇතුලතදී ආධුනික තාපසයෙකු බවට පත්වීමට එතුමාට හැකිවූයේ එතුමා තුළ තිබූ සහජ දක්ෂතාවය නිසාමය. 1618 දී වැඩිදුර අධ්‍යාපනය සඳහා රෝමයට යවන ලදී,

මෙතුමා දෙව්සත්හල තුළ වඩාත් ඉක්ම නින්ම ප්‍රසිද්ධ චරිතයක් බවට පත්වූයේ මෙතුමාගේ දැඩි භක්තිය හා ජ්වලිතකම නිසාමය. මෙම ජ්වලිත භාවය නිසාම පුංචි දේවල් වඩාත් නිවැරදිව කිරීමට මෙතුමා මහත්සේ උනන්දු විය. එම වසරේදීම ඔහුගේ පියා පූජාත්වරය ලබා මාස 6 ක් යන විට මරණයට පත්විය. මෙම සිද්ධිය එතුමා දෙව්සත්හල් දිවියේ මුහුණදුන් වේදනාත්මක සිද්ධියක් වුවද, කිසිවිටෙක අධෛර්යට පත් නොවීය. එබැවින් මෙතුමා තම අධ්‍යාපන කටයුතු වල වඩාත් උනන්දුවෙන් නිරත විය. කෙතරම් දක්ෂයෙකු වුවද මෙතුමා තුළ වූ බැහැපත්කම, දෙව්සත්හලේ අනෙක් සිසුන්හට අභියෝගයක් විය. බැහැපත්කම ප්‍රගුණ කරනු වස් දිළිඳු කම ආයුධයක් කරගත් මෙතුමා දිනක් ඈන්ට්වර්ප් නගරයේ සිට රෝම පුරවරයට පයින්ම ගමන් කළ බව සඳහන්වේ.

දෙව්සත්හල් අතර පැවති විවාදයක් සඳහා මෙතුමාව තෝරාගත් නිසා, තම දෙව්සත්හල කෙසේ හෝ ජයග්‍රහණය කරවන්නෙමි යි යන්න අධිෂ්ඨාන කළ මෙතුමා මහත් කැපවීමෙන් ඒ සඳහා දිවා රෑ නොබලා පාඩම් කළේය. පැවති දැඩි ශීතලද නොතකා පාඩම් කිරීම නිසා එතුමා අසනීප විය. විවිධ ප්‍රතිකාර සිදු කළද, පලක් වූයේ නැත. දිනෙන් දිනම රෝගය උත්සන්න වූ අතර රෝගය කුමක්දැයි සොයා ගැනීමට පවා වෛද්‍යවරු අපොහොසත් වූහ. මෙලෙස රෝගය වැළඳී සතියකින් එතුමා ස්වර්ග ස්ථ විය. ඒ 1621 අගෝස්තු 13 වන දිනදීය. එතුමා චීනයේ ධර්මදූත සේවය සඳහා ආශාවෙන් පසුවුවද එයට ප්‍රථම මරණයට පත්වූයේ සමහරවිට එය දෙවිඳුන්ගේ අභිමතය වූ නිසා විය හැකිය.

එතුමාගේ දේහය මිහිදන් කරනු ලැබුයේ ශු. ඉග්නාසියුස් මුනිඳුන්ගේ දෙව්මැදුරෙහිය. එතුමන්ගේ හදවත ලුමේන් දෙව්මැදුරේ තැන්පත් කර තිබේ. මෙතුමාගේ මැදිහත්කම තුළ සිදුවූ ප්‍රාතිහාර්යන් හේතුවෙන් එතුමන්ගේ ඡායා රූපයේ පිටපත් 20,000 කට අධික ප්‍රමාණයක් මුද්‍රණය කර බෙදාහරින ලදී, 1888 නොවැම්බර් 26 වන දින මෙතුමාව ශුද්ධවරයට ඔසවනු ලැබීය. මෙතුමා පූජා සහයකයන්ගේ නාම සාන්තුවරයාණන් ලෙස ශු. සභා මාතාව ප්‍රකාශයට පත්කර ඇත. ශු. ජෝන් බර්ච්මන්ස් මුනිඳුන්ගේ මංගල්‍යය නොවැම්බර් 26 වන දිනට යෙදේ. මෙතුමන්ගේ දැනට පවතින එකම ප්‍රතිමාව කොළඹ අගරදගුරු පදවියේ තෝප්පුව මීසමට අයත් බම්බුකුලිය ශු. ස්නාවක ජුවාම් තුමාගේ දෙව්මැදුරේ තැම්පත් කර ඇත.

**ශු. ස්නාවක ජුවාම් පූජා සහයක සමිතිය**

බම්බුකුලිය

## දේව අම්මේ



දෙව්ඳු වචනයට අවනතව සතුටින්
නිරතුරු තම දිවිය දැහැමෙන් ගත කරමින්
සාමයේ කුමරුන් මෙලොවට බිහි කළේ
ඔබමයි මාගේ දේව අම්මේ
කුරුසියේ එල්ලී සිටි
ඔබ පුතු වෙත දෑස් යොමා
කුරුස ගසේ පාමුල සිටිමින්
හැම දෙයක්ම දරා ගත්තේ
ඔබමයි මාගේ දේව අම්මේ

**ෂෙහාරා ලක්ෂාණි පෙරේරා** - 9 ශ්‍රේණිය
උත්ථාන වූ කිතු සමිඳුන්ගේ දහම් පාසල
දංකොටුව (ගොඩැල්ල මීසම)

## ජේසුගේ කුඩා මල

**කිතුනු ගමන් මගෙහි පැමිණි**
**ජේසුගේ කුඩා මල වූ**
**පුංචි අපව රැක බලනා**
**රෝස මලක් බඳු**
**ශු. තෙරේසා මුනිතුමියෙනි**
**නොමඟ යන සැම දන හට**
**යහ මඟ පැහැදිලි කරමින්**
**අපිත් හැදෙමු එතුමිය මෙන්**
**විකසිත වූ මලක් වෙලා.....**



**හිරුනි අමන්දා** - 9 ශ්‍රේණිය
සා. ජෝශප් දහම් පාසල - වෙන්නප්පුව

## නොනිමි මව් සෙනෙහස



රෝස මලක මල්පෙත්තක්
වැටෙනා පිණිබිඳු මෙන් මගේ
ජීවිතය දිනෙන් දින පුබුදුවාලමින්

ගුරුහරුකම් කියලා දුන් අම්මේ
ඔබ ලෝකයට ආලෝකය ගෙන දෙන
මිණි පහනයි අම්මේ

**දිනුෂ්ක බිටෝ**
9 ශ්‍රේණිය
ශා. බෙනඩික් දහම් පාසල - වයික්කාල

## යදිමු අපිත්...



වඩිනු මැනේ කිතු ජීවමාන සංකේතය
ෆ්‍රැන්සිස් සුදතුම් පිය රජිඳු
අප ලක් දෙරණට
නොමඳව බබළන කිතු පහනට
කිතු දන පුබුදන ආලෝකය වීමට
පත් කළ මැන අප ජුසේ වාස් මුනිඳු
ශුද්ධවරයට එදින
එතුමා කළ ඒ කිතු මෙහෙවර
සැමදා ජීවමාන ලෙස වැජඹීමට
කළ ඒ අමිල මෙහෙවර
ජුසේ මුනිඳු සාන්තුවරයට එසවීමට
අපිදු යදිමු දෙව් පුතු නිබඳව

**දිනුක මධුනුවන් ප්‍රනාන්දු**
11 ශ්‍රේණිය
ශු. පවුලේ දහම් පාසල - මිල්ලව

## දෙව්ඳු ප්‍රේමය

කුසගිනි වෙලේ මට සරණ වුණේ ඔබයි සමිඳුනී
හැම අයෙකුම අත හැරී විට ළඟ සිටියේ ඔබයි සමිඳුනී
ජීවිතයේ හරිමඟ පෙන්වන්නේ ඔබයි සමිඳුනී
දෙපා වාරු නැති මට සවිය ස්වාමිනී

දුකයි - සැපයි දෙකම ඔබයි පියාණෙනී
එඬෙරෙකු ලෙසින් මට රැකවරණය දුන් පියාණෙනී
ස්වර්ගයේ දොරගුළු විවර කළේ ඔබයි පියාණෙනී
අසරණ මට සරණය වන්නේ ඔබයි ස්වාමිනී

**පූර්ණා අචින්ත්‍යා ප්‍රනාන්දු**
7 ශ්‍රේණිය
ශා. තෙරේසා දහම් පාසල - පේරාදෙණිය

**මාසික සිතුවිල්ල**



**"නොවැම්බර් මාසය"**
**ළමා ප්‍රදීපය, අංක 02,**
**ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**

සේයා :-
**ශ්‍රියාංගණී පිලීෂියා**

# ප්‍රහේළිකා අංක 48



### හරහට

1. ක්‍රිස්තුන් වහන්සේ තම ඉගැන්වීම් වලට මෙම ගස බොහෝ විට යොදා ගත් සේක.

4. යක්ෂයා ක්‍රිස්තුන් වහන්සේව උස් තැනකට පමුණුවා , ලෝකයේ සියළු රට රාජ්‍යයන් හා ඒවායේ ..... ඉසුරු ද පෙන්වා, යක්ෂයාට වඳින්නේ නම් ඒවා ලබා දෙන බව කීවේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ....................විශ්වාස කිරීම සෙවනැන්ලක් අල්ලා ගැනීම වැනියැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. . මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. මිනිසෙකුගේ ගමන් මග සමිඳාණෝ මෙහෙයවන සේක. එසේනම් යමෙකුට තමා.................. මග තේරුම් ගත හැකිදැයි හිතෝපදේශයේ විමසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

### පහළට

1. ''ක්‍රිස්තියානි'' යන නාමය ගෝලයින්ට පළමු කොට දෙනු ලැබුවේ මෙහිදීය.

2. ක්‍රිස්තුන් වහන්සේ පන්දහසකට කෑම ලබා දීමේ සිද්ධියට පෙර මෙම මුහුදෙන් එගොඩට වැඩම කළ බව ශුද්ධවූ ජුවාම් තුමා පවසයි.

3. පව්කාරයා මනස්ථාපනය වී පැමිණෙන තුරු දෙව්පියාණන් වහන්සේ අත් නොහැර බලා සිටින බවත්, එසේ පැමිණි විට සන්තෝෂවන බවත් පෙන්වූ එක් උපමාවකි, නැති වූ ......... පිළිබඳ උපමාව. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. වෙහෙසවන , බර උසුලන සියල්ලෙනි, මා වෙතට එන්න. මම ඔබට ...... දෙමි. ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. ජෝසප්ගේ සහෝදරයන් ඔහු සමග ඊර්ෂ්‍යාවෙන් ජෝසප්ව මෙවැන්නක හෙලුවේය.

මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. ශු. ලූක් 4/6, 15/8, ශු මාක් 11/20, ශු. මතෙව් 11/28 , ශු. ජුවාම් 6/1, ක්‍රියා 11/26, උපදේශකය හෙවත් සිරාක් 34/2, හිතෝපදේශය 20/24, උත්පත්ති 37/24

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර**

## ගාල්ල දහම් ළමෝ ගුරුභවතුන්ට උපහාර පුදති.

ලෝක ගුරු දිනයට සමගාමීව ගාල්ල, ශුද්ධවූ ජපමාල රාජේශ්වරියගේ දහම් පාසලේ ශිෂ්‍ය නායක මණ්ඩලය දහම් ගුරුවරුන් වෙනුවෙන් ගුරු උපහාර දිනයක් පැවැත්විය. එහිදී ගුරුභවතුන්ට පදක්කම් පැළඳවීය. ''ගුරු භූමිකාව'' පිළිබඳව ශානි ඔබේසේකර ශිෂ්‍යනායිකාව එදින රැස්වීමේදී හරවත් කතාවක් කළ අතර උපහාර උත්සවය මීසම් ශාලාවේ පැවැත්විණි. ශිෂ්‍යනායක මණ්ඩලය විසින් ගුරු මණ්ඩලය චාරිත්‍රානුකූලව පිළිගෙන ''ගුරු උපහාරයන්හි ප්‍රායෝගික වැදගත්කම'' පිළිබඳව ප්‍රධාන ශිෂ්‍යනායක සේසත් මදුහාර අදහස් දැක්වීය. **මංගල ජයවර්ධන**



මෝදර ලුණුපොකුණ සා. අන්ද්‍රේ දහම් පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයට මුල්‍යමය ආධාර ලබා ගැනීම සඳහා පොළක් මීසම් සේවක ගරු සුදත් ජයලාල් සිල්වා පියතුමාගේ අනුශාසකත්වයෙන් මීසම් ගෘහය ඉදිරිපිටදී පැවැත්වුණි. මෙහි ඡායාරූපයක් සේයාරුවෙහි දැක්වේ. **කමල් සිල්වා**

**ළමා ප්‍රදීපය වැඩියෙන්ම අලෙවි කරන මීසම් පිළිබඳව තොරතුරු ලබන සතියේ ........**

# දංකොටුව බාලිකා විදුහලේ දරු දැරියන්ගේ කලා හැකියාවන්







දංකොටුව බාලිකා මහ විදුහලේ ප්‍රාථමික අංශයේ කලා හැකියාවන් ඔප් නන්වන සංස්කෘතික උත්සවය පසුගියදා එම විදුහලේ බ්‍රියටිස් ශාලාවේදී පැවැත්විණි. විදුහල්පතිනි ගරු බර්නදෙත් පැවිදි සොයුරියගේ මගපෙන්වීම මත ප්‍රාථමික අංශ ප්‍රධානී ගරු ගර්ට්රූඩ් පැවිදි සොයුරිය ඇතුළු ගුරුමණ්ඩලය විසින් මෙය සංවිධානය කොට තිබිණි.

**සේයා: මිලාන් පීරිස් /**
**සටහන : ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු**









